# ඔහොම යං

රාජ්‍ය නොවන සංවිධානවල බැළ මෙහෙවර කරන්නවුන්ගේ හැර දේශපාලනය ගැන උනන්දුවක් දක්වන්නවුන්ගේ විරෝධයට ලක් වූ ප්‍රධාන ම රාජ්‍ය නොවන සංවිධානය බර්ග්හෝෆ් සංවිධානය (පදනම) යැයි සිතමි. එකී සංවිධානයෙහි නියෝජිතයන් මෙන් ම එහි ගැත්තන් ද කියනු ඇත්තේ එය රාජ්‍ය නොවන සංවිධානයක් නොවන බව ය. හුදු නීත්‍යානුකූල තත්වය සැළකුවහොත් එහි ඇත්තක් වෙයි. එහෙත් දේශපාලනය යනු නෛතික අර්ථදැක්වීම්වල එකතුවක් නො වෙයි.

බර්ග්හෝෆ් සංවිධානය මේ අවස්ථාවේ අපේ අවධානයට යොමුවන්නේ එහි අධ්‍යක්‍ෂක ආචාර්ය නෝබට් රොපර්ස් මහතාගේ වීසා බලපත්‍රය දීර්ඝ නොකරන බවට දින විස්සක් පමණ කල් දී ඇතැයි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු සතිඅන්ත ඉංගිරිසි පුවත්පතකට කර ඇති ප්‍රකාශය හේතුවෙන් ය. සරල බසින් කිවහොත් ආණ්ඩුව බර්ග්හෝෆ් නායකයාට ගෙදර යන ලෙස කියා ඇත.

බර්ග්හෝෆ් සංවිධානය ලංකාවේ නිල වශයෙන් පිහිටුවීම ඇරඹී ඇත්තේ 2001 ජුලි මාසයෙහි ය. චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව යහපත් ආණ්ඩුකිරීම ඉගැන්වීමට යැයි කියමින් පැමිණි බර්ග්හෝෆ් සංවිධානයට දොර ඇර දුන්නේ ය. බර්ග්හෝෆ් සංවිධානය කියන ආකාරයට ඒ සංවිධානය පිහිටුවා ඇත්තේ 2001 ජුලි මාසයෙහි බර්ග්හෝෆ් පදනම හා ලංකණ්ඩුවේ ව්‍යවස්ථාදායක කටයුතු සඳහා වූ අමාත්‍යාංශය අතර ඇතිකරගන්නා ලද අවබෝධතා ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස ය. අවබෝධතා ගිවිසුම අනුව බර්ග්හෝෆ් පදනම සමාගම් පණත යටතේ ලියා පදිංචි කෙරී ඇත.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය යනු අවුං සාන් සුකී, බෙනාසීර් භුතෝ වැන්වුන් මෙන් ම දේශපාලනඥයන්ගේ දියණියක හා බටහිර විශ්වවිද්‍යාලවල උගත්තේ යැයි කියනු ලැබීමට අමතරව බටහිර නියෝජිතවරියක ද වන්නී ය. භුතෝ මහත්මිය ආපසු පකිස්ථානයට ගියේ මරණයට මුහුණදීමට නොව බටහිර දේශපානඥයන්ගේ විශේෂයෙන් ම ඇමරිකාවේ අවශ්‍යතාවට අනුව ය. ඇය මුෂරාෆ් ජනාධිපතිවරයා සමග ගිවිසුමකට එළඹත ඇත්තේ ද බටහිර අවශ්‍යතා අනුව ය. කෙසේ හෝ මේ දේශපාලන දියණුවරුන් පමණක් නොව අද දවසේ දේශපාලන ලේලියක ද වූ සෝනියා ගාන්ධි මහත්මිය ද බටහිර දේශපාලන අවශ්‍යතාවලට අනුව මෙහෙයවෙයි. ඔවුහු අන්කල් සැම්ගේ ලේලියෝ වෙති. පාකිස්ථානයට හා ඉන්දියාවට නොහැකිවුවත් (භුතෝ මහත්මියගෙන් පසුව පකිස්ථාන ජනතා පක්‍ෂයෙහි නායකත්වයට ඇගේ දහඅට හැවිරිදි පුතා පත්කරගනු ලැබ ඇත.) ථෙරවාදී ලංකාවට හා මියන්මාරයට මේ දේශපාලන පවුල් හරගා කෙරෙන බලපෑම්වලින් යම් පමණකට හෝ නිදහස්වීමට හැකි වී තිබේ. ඒ කෙසේ වෙතත් 2001 දී බර්ග්හෝෆ් පදනම නමින් සංවිධානයක් පිහිටවනු ලැබුයේ ආණ්ඩුවේ, එවකට සිටි ජනාධිපතිනියගේ හා ඇතැම් මැති ඇමතිවරුන්ගේ ආශිර්වාදය මධ්‍යයෙහි ය. එයට ප්‍රතිපාදන ලැබුනේ ජර්මනියෙන් හා ස්විට්සර්ලන්තයෙනි.

බර්ග්හෝෆ් පදනම වෙනත් රාජ්‍ය නොවන සංවිධානවලට ද වඩා බලගතු රාජ්‍ය නොවන සංවිධානයක් බව ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වෙයි. එය ලංකාණ්ඩුවේ ආශිර්වාදය මධ්‍යයෙහි ආණ්ඩුවේ අමාත්‍යාංශයක් සමග ඇතිකරගන්නා ලද අවබෝධතා ගිවිසුමක් මත පිහිටුවන ලද සංවිධානයකි. ආරම්භයේ සිට ම බර්ග්හෝෆ් පදනම මැති ඇමතිවරුන් වෙනුවෙන් විදේශ සංචාර හා වෙනත් දෑ සංවිධානය කළ බව රහසක් නො වේ. මේ අධ්‍යාපනික චාරිකාවලට වඩා වෙනත් ආකාරයක සංචාර විය. මේ සංචාර හා වෙනත් තෑගි බෝගවලින් බලාපොරොත්තු වූයේ මැති ඇමතිවරුන් බා ගැනීම යැයි කීම නිවැරදි ය. මැති ඇමතිවරු පමණක් නොව ඊනියා බුද්ධිමත්තු ද එවැනි වරප්‍රසාද ලාභීහු වූහ.

බර්ග්හෝෆ් පදනම යහපත් ආණ්ඩුකිරීම යනුවෙන් අදහස් කෙළේ එකම එක දෙයකි. ඒ අන් කිසිවක් නොව මෙරට සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීම ය. එහි දී බොරු මානව අයිතිවාසිකම් ගැන ද බර්ග්හෝෆ් පදනම කතාකිරීමට අමතක නො කෙළේ ය. අද ව්‍යාජ මානව අයිතිවාසිකම් ගැන කතාකරන්නවුන් 1989- 1992 අවධියෙහි දී මානව අයිතිවාසිකම් ගැන කතාකළ බවක් කිසිවකුටවත් මතක ඇතැයි නො සිතමි. බටහිර රටවලට අහිංසක සිංහල තරුණ තරුණියන් ඝාතනය කරනු ලැබීම එතරම් ගණන්ගත යුතු කරුණක් නො වී ය. මා මෙයින් අදහස් කරන්නේ එදා ජ වි

© Prof. Nalin De Silva

පෙ ගත්මග නිවැරදි ය යන්න නො වෙයි. අද ද කොටි සංවිධානයේ සාමාජිකයන්ට අමතර ව ඇතැම් අහිංසකයන් ද අත් අඩංගුවට ගැනෙනු ඇත. ආණ්ඩුව කළ යුත්තේ ඒ වැරදි අත් අඩංගුවට ගැනීම් අවම කිරීමට කටයුතු කිරීම ය. ආණ්ඩුවට බල කළ යුත්තේ ඒ සඳහා ය. එසේ නැතිව ආණ්ඩුවේ මානව අයිතිවාසිකම් කඩකිරීම් ගැන සඳහන්කර ආණ්ඩුව පෙරලීමට කටයුතු කිරීම කොටින්ට උදව්දීමකි.

බර්ග්හෝෆ් පදනමේ අධ්‍යක්‍ෂකවරයාට පසුගිය දිනෙක පාර්ලිමේන්තු කමිටුවක් ඉදිරියේ පෙනී සිටීමට දැනුම්දුන් විට ඔහු තෙවතාවක් ම ඒ මගහැර ඇත. ඔහු කියා ඇත්තේ පදනමට මුදල් දෙන රටවල් ඔහුට පාර්ලිමේන්තු කමිටුව ඉදිරියට නොයෑමට උපදෙස්දුන් බව ය. මෙයින් ඔහු පමණක් නොව ඔහු කියන දේ ඇත්ත නම් ඒ රටවල් ද කර ඇත්තේ පාර්ලිමේන්තුවේ හා එමගින් නියෝජනය වන ජනතා පරමාධිපත්‍යයට නිග්‍රහකිරීමකි. පමා වී හෝ බර්ග්හෝෆ් අධ්‍යක්‍ෂකවරයාට රටින් පිටවී යෑමට කීම අගය කළ යුත්තකි. එපමණක් නොව බර්ග්හෝෆ් පදනමේ ක්‍රියාකාරීත්වය ද තහනම් කිරීම පිළිබඳ සිතා බැලිය යුතු ය.

මේ ලියන මොහොතේ වැදගත් ප්‍රවෘත්තියක් දැනගැනීමට ලැබිණි. ඒ අනුව අපකීර්තිමත් සටන් විරාම ගිවිසුමෙන් ඉවත්වීමට රජය තීරණය කර ඇත. රනිල් වික්‍රමසිංහ මහතා නෝර්වේ ඔස්සේ පැමිණි බටහිර බලපෑම් හේතුවෙන් හා ඒ මහතා මෙරට බටහිරයන්ගේ ප්‍රධාන නියෝජිතයකු වූ බැවින් (අනෙක් ප්‍රධාන නියෝජිතයා ප්‍රභාකරන් වෙයි.) අපකීර්තිමත් සටන් විරාම ගිවිසුම වන්නියට ගොස් අත්සන් කෙළේ ය. එදා වන්නියට ගිය ජනමාධ්‍යවේදීන් යැයි කියන්නවුනට කොටි සැලකූ ආකාරය විවිධ ජනමාධ්‍ය සංවිධානවලට දැන් අමතක වී ඇත. මතක තිබුණත් මේ වීරයන්ට උද්ඝෝෂණය කළ හැක්කේ ලංකාණ්ඩුවට විරුද්ධව කොටුව දුම්රිය පොළ ඉදිරිපිට හෝ ලිප්ටන් වටරවුමේ ය. අඩුම තරමින් ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණයකිරීමේ හා ලිවීමේ නිදහසවත් මේ ජනමාධ්‍ය වීරයන්ට ඇති බව ඔවුන්ට වැටහෙන බවක් පෙනෙන්නට නැත. විශ්වවිද්‍යාලවල ජනමාධ්‍යවේදය උගන්වන්නවුන් ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ඇති ජනමාධ්‍ය නිදහස ගැන උගන්වන පාඩම් පෙනෙන්නට නැත. හදිසි නීති ඇති විටෙක යුද්ධ අවස්ථාවල ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ජනමාධ්‍ය නිදහස ගැන මේ අය උගන්වන්නේ නම් මැනවි.

අපකීර්තිමත් සටන්විරාම ගිවිසුමට විරුද්ධව අපි ඒ දිනවලම ලීවෙමු. ඒ අහෝසි කරන ලෙස ද කියා සිටියෙමු. එහෙත් රනිල් වික්‍රමසිංහ මහතා කිසි දිනෙක ඒ නොකරන බවත් අපි දැන සිටියෙමු. මේ ආණ්ඩුව බලයට පත් වූ විගස මේ ද්‍රෝහී ගිවිසුම අහෝසිකිරීමට පියවර ගත්තේ නම් අපි වඩාත් සතුටු වෙමු. එහෙත් ආණ්ඩුවේ ස්ථාවරත්වය පිළිබඳ ප්‍රශ්න තිබූ හෙයින් එක්විට එසේ කිරීමට නොහැකි වන්නට ඇත. කෙසේ හෝ පසුගිය අයවැයෙන් පසු ආණ්ඩුවට නැවත වරක් ජනවරමක් ලැබී ඇතිවා පමණක් නොව විජාතික බලවේග පරාජය කිරීමට හැකියාවක් ඇති බවට ආත්ම විශ්වාසයක් ද ලැබී ඇත. ආණ්ඩුවකට අවශ්‍ය නම් බටහිරයන්ට හිස නොනමා කටයුතු කළහැකි බව දැන් පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ බටහිරයන් හා අනෙක් විජාතික බලවේග දැන් සියල්ල අකුලාගෙන ඇත යන්න නො වෙයි. ඔවුන් ආණ්ඩුව පෙරලීමට තව තවත් උත්සාහ දරණු ඇත. එහෙත් ජනතාව ආණ්ඩුව සමග නම් විජාතික බලවේග පැරදවීම අමාරු කාර්යයක් නො වෙයි. දැන් ආණ්ඩුවට ආත්ම විශ්වාසයක් මෙන් ම ආත්ම ශක්තියක් ද ඇත. ඒ තව තවත් වර්ධනය කළ හැකි අතර සියළු ආකාරයේ කුමන්ත්‍රණ ගැන ද සෙවිල්ලෙන් සිටිය යුතු ය. ජනවහරේ එන කියමනක් අනුව අපට දැන් ආණ්ඩුවට කීමට ඇත්තේ ඔහොම යං කියා ය. ආණ්ඩුවට ඒ ඒ අවස්ථාවේ දී යා හැකි දුර කොපමණ දැයි තීරණය කළ හැක්කේ ආණ්ඩුවට පමණ ය. විවිධ බලවේග අතර ශක්තිය කිරා මැන ඒ ඒ අවස්ථාවට උචිත ආකාරයට තීරණ ගැනීමට ආණ්ඩුවට සිදුවෙයි. මින් පසු විල්කොටලාට මාරුවීම් ලබාගැනීමට ඉඩ නොතැබිය යුතු ය. යම් තානාපතියන් රටේ ස්වෛරීභාවයට එරෙහිව කටයුතු කරන්නේ නම් ඔවුන් නොමනා පුද්ගලයන් ලෙස නම්කිරීමට ආණ්ඩුවට හැකිවිය යුතු ය.

බොහෝ කලකට පෙර නෝර්වේ තානාපති කාර්යාලය ඉදිරිපිට අප කළ උද්ඝෝෂණයකට සහභාගි වූයේ තිස්පස් දෙනකු පමණ ය. ටී. එන්.එල්. රූපවාහිනී නාලිකාව සහභාගි වූ සංඛ්‍යාව ද ප්‍රවෘත්ති ප්‍රචාරයෙහි දී සඳහන්කිරීමට තරම් කාරුණික විය. අපි අධෛර්යමත් නො වීමු. දශක දෙකකට පමණ පෙර අප යුදවාදීන් ලෙස හැඳින්වූවන් බොහෝ දෙනකු අද අප සමග වීම ගැන අපට ඇත්තේ සතුටකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva